**දඹුල්ල මහා නගර සභාව.**
**-------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**
**----------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන.
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 17 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝබර් 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය
**--------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
**---------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-------------------------**

ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම රු.167,059,672 ක් ලෙස ගිණුම් ගත කර ඇතත්, එම ගිණුමෙහි ගොඩනැගිලි වලට අයත් ඉඩම් වල වටිනාකම තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්.
**------------------------------**

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සේවක ණය ශේෂය සහ ඊට අදාල උපයෝගි ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂය අතර රු.8,000 ක වෙනසක් පැවතුණි.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
**------------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයන් 09 කට අදාළ එකතුව රු.229,312,564 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය.

--------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

--------------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,725,364 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,969,900 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,244,536 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

-----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු. 33,406,405 ක් ගෙවා තිබූ නමුත් වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් ලැබී තිබුණේ රු. 31,965,210 ක් පමණි. ඒ අනුව සභාවේ ආදායමෙන් රු. 1,441,195 ක මුදලක් සභා සේවකයන්ගේ වැටුප් ගෙවීමට වැය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.768,621 කින්ද, කඩකුලී ආදායම රු.6,481,837 කින්ද, වෙළඳ බලපත්‍ර ආදායම රු.606,510 කින් සහ සේවා ගාස්තු ආදායම රු.2,957,224 කින් වැඩිවී තිබුණද, එයට ප්‍රතිරූපීව සැපයුම් හා උපකරණ වියදම රු.1,988,399 කින්ද, වැටුප් හා වේතන රු.7,994,623 කින්ද, ක්ෂය හා හානිකරණය රු.2,516,606 කින් සහ දේපල පිරියත හා උපකරණ නඩත්තු වියදම් රු.1,839,629 කින්ද වැඩිවී තිබීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) **මුළු ආදායම, මුළු වියදම අතර අනුපාතය**

------------------------------------------

වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 98 ක් තරම් මුළු වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවතින. ඉකුත් වර්ෂයේ තත්ත්වය සමඟ සැසඳීමේදී මෙය සතුටුදායක තත්ත්වයක් නොවන බව පෙන්නුම් කෙරේ.

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1. ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය.

-------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට මහා නගර සභාවේ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.1.1 දිනට හිඟය | 2014 වර්ෂයේ බිල් කිරීම් | ලැබිය යුතු මුළු මුදල | වර්ෂයේ බිල් කිරීම් වලින් ලැබීම් | හිඟ ශේෂයෙන් ලැබීම් | මුළු ලැබීම් | 2014.12.31 දිනට හිඟය | හිඟ ශේෂයෙන් ලැබීම් ප්‍රගතිය | 2014 බිල් කිරීම් වලින් රැස් කිරීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | (1) | (2) | 3=(1+2) | (4) | (5) | 6=(4+5) | (3-6) | % | % |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | | |
| වරිපනම් බදු | 4,079,369 | 4,592,571 | 8,671,940 | 2,400,482 | 1,063,775 | 3,464,257 | 5,207,683 | 26 | 52 |
| බදුකුලී | 39,472,923 | 11,408,646 | 50,881,569 | 6,965,059 | 2,563,338 | 9,528,397 | 41,353,172 | 6.4 | 61 |
| බලපත්‍ර ගාස්තු | 1,088,372 | 6,341,994 | 7,430,366 | 5,266,488 | 730,772 | 5,997,260 | 1,433,106 | 67 | 83 |
| සේවා සඳහා ගාස්තු | 55,500 | 7,953,050 | 8,008,550 | 7,885,550 | 55,500 | 7,941,050 | 67,500 | 100 | 99 |
| වරෙන්තු ගාස්තු සහ දඩ මුදල් | 1,274,165 | 1,559,935 | 2,834,100 | 28,105 | 1,050,000 | 1,078,105 | 1,755,995 | 82 | 1.8 |
| **එකතුව** | | | | | | | | | |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු වරිපනම් බදු ආදායමෙන් වර්ෂය තුළ අයකර ගෙන තිබුණේ සියයට 26 කි. 2014 දෙසැම්බර් 31 දිනට රු.5,207,683 ක් අය වීමට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ලැබිය යුතු බදු කුලී ආදායමෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ සියයට 19 කටත් වඩා අඩු ප්‍රතිශතයකි. ඒ අනුව තව දුරටත් රු.41,353,172 ක් අය වීමට තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ප්‍රධාන ආදායම් ශීර්ෂ 05 හි හිඟ ආදායම් වල එකතුව රු.49,817,456 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස්කර ගැනීම කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

## 2.3.2 වෙනත් ආදායම්

-------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සිනමා ශාලාවේ ප්‍රදර්ශනය කරන ලද දර්ශන වෙනුවෙන් හිඟ විනෝද බදු ලෙස රු.118,674 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සතිපොල බදු දීම වෙනුවෙන් අයවිය යුතු රු.303,418 ක බදු මුදල අයකර ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය.

--------------------------------

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභාව සතු වාහන වලට ඉන්ධන ලබා ගැනීමේදී ඇණවුම් කරන ලද රු.65,185 ක් වූ ලීටර් 539.58 ක් පිළිබඳ විස්තර ධාවන සටහන් පත් වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) නගරාධිපතිවරයාගේ නිල වාහනය සඳහා මාසික ඉන්ධන සීමාවන් මහා සභාව විසින් අනුමත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුල ඩීසල් ලීටර් 6365.34 ක ප්‍රමාණයක් සභාවෙන් නිකුත් කර තිබුණි.

(ඇ) මධ්‍යම පළාත් සභාව හා අනෙකුත් ආයතන වෙතින් ලැබී තිබුණු වාහන 08 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) සිනමා ශාලාව ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් පරිභෝජනයට යොදා ගෙන තිබුණු විදුලිය හා ජලය වෙනුවෙන් අයවිය යුතු රු.84,905 ක ගාස්තු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.2 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත වත්කම්

---------------------------------------------

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ලබාදී තිබුණු ජීප් රථ දෙකක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවතින.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

කර්මාන්ත සම්බන්ධයෙන් 2015 අප්‍රේල් 28 දින කරන ලද භෞතික පරික්ෂාවේදි අනාවරණය වු කරුණු පහත දැක්වේ.

| | කොන්ත්‍රාත්තුවේ නම | කොන්ත්‍රාත්කරු | ප්‍රතිපාදන | ඇස්තමේන්තු මුදල රු. | නිරීක්ෂණය වූ අඩුපාඩු |
|---|---|---|---|---|---|
| (අ) | පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම - රත්මල්ගහඇල | රත්මල්ගහඇල ගොවි සංවිධානය | ගම නැගුම | 400,000 | i. වැඩ විෂය අංක 03 යටතේ කුළුණු සඳහා 12cm දහර වානේ කම්බි යෙදිය යුතු වුවත් එක් කුළුණක් සඳහා දහර වානේ කම්බි යොදා නොතිබුණි.<br>ii. වැඩ විෂය අංක 08 යටතේ කුළුණු 09 ක් සහ ප්ලින්ත් බීම් 04 ක් සඳහා 12cm දහර වානේ කම්බි 205.50kg ක් සඳහා රු.47,676 ක් ගෙවා ඇතත් යොදා තිබුණේ 10cm දහර වානේ කම්බි බව අනාවරණය විය.<br>iii. කර්මාන්තයට අදාළ ඉඩම මහා නගර සභාවට පවරාගෙන නොතිබුණි. |
| (ආ) | තිත්තවැල්ගොල්ල සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම. | තිත්තවැල්ගොල්ල රණබිම ගොවි සංවිධානය | ආසන සංවිධායකගේ විශේෂ ප්‍රතිපාදන | 500,000 | ඉඩම සභාවට පවරාගෙන නොතිබුණි. |
| (ඇ) | තිත්තවැල්ගොල්ල සායන මධ්‍යස්ථානය හා කාය වර්ධන මධ්‍යස්ථානය | -එම- | එක ගමකට එක වැඩක් | 1,001,190 | i. ගොඩනැගිල්ල ඉදිකළ සිමෙන්ති ගල්වල ප්‍රමිතිය පරික්ෂා කර නොතිබුණු අතර එම ගල් පහසුවෙන් කැඩී යා හැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. |
| | | | සභා අරමුදල | 1,000,000 | ii. වැඩ විෂය අංක 14 අනුව නාම පුවරුවක් සකස් කර නොතිබුණි.<br>iii. වහලයට දැව යොදා අලුතින් ඇස්බැස්ටෝස් ෂීට් සවි කළ යුතු වුවත්, පරික්ෂා කිරීමේදී පරණ යකඩ සහ පරණ ඇස්බැස්ටෝස් ෂීට් යොදා වහලය සකස් කර තිබුණි.<br>iv. ඉඩම මහා නගර සභාවට පවරාගෙන නොතිබුණි. |

## 3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

නගර සභා බල ප්‍රදේශයේ එකතු කරන කසල, සභාවේ ට්‍රැක්ටර් හතරක් සහ ටිපර් රථයක් යොදා ගනිමින් දිගම්පතහ ප්‍රදේශයේ රජයේ ඉඩමකට දිනපතා බැහැර කරන අතර මෙමඟින් විවිධ පාරසරික ගැටළු පැනනැගී ඇති බවත් දක්නට ලැබුණි. කසල ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන් සඳහා සභාවේ අවධානය යොමුවී ඇතත්, නිවැරදිව එකී කටයුතු ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය.

---------------------------------------------

## 4.1 විගණන කමිටු.

-------------------

2014 අගෝස්තු 01 දිනැති ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක සීපීසී/සීඑල්ජී/116 දරන චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු පිහිටුවා ඇතත් විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 4.2 අයවැය පාලනය.

----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

I. සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මඟින් වැය විෂයයන් 5 ක් සඳහා ඇස්තමේන්තු කර තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.1,037,269 ක වියදම් දරා තිබුණි.

II. අයවැය ලේඛනය මඟින් වැය විෂයන් 22 ක් සඳහා සලසා දී තිබූ රු.848,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයන්ට මාරු කිරීම් හා ඉතිරි කිරීම් සිදුකර තිබුණි.

## 4.3 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්.

--------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් එක් විමසුමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු, අතර එම විමසුමට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.1,162,000 ක් විය.

## 5. පද්ධති හා පාලන

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.

(ආ) ආදායම් පරිපාලනය .

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) වාහන පාලනය.